# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1267 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2023

දිනය / திகதி / Date: 07/10/2023
පැය 1245

## මාධ්‍ය නිවේදනය

**පොලිස් කොස්තාපල් අගම්පොඩිගේ මනෝජ් ප්‍රියංකර නිලධාරියා පොලිස් සැරයන් නිලයට උසස් කිරීම හා දෙමාපියන්ට මූල්‍යමය පරිත්‍යාග පිරිනැමීම.**

කොළඹ රථවාහන කොට්ඨාසයට අනුයුක්තව කුරුඳුවත්ත පොලිස් ස්ථානයේ විශේෂ රාජකාරි යොදවා සිටියදී 2023.10.05 වන දින කුරුඳුවත්ත පොලිස් වසමේදි සිදුවු මාරක අනතුරකින් මියගිය ආධුනික පොලිස් කොස්තාපල් 19498 අගම්පොඩිගේ මනෝජ් ප්‍රියංකර නිලධාරියා පොලිස් කොස්තාපල් තනතුරේ ස්ථිර කර, පශ්චාත් උසස්වීම් පදනම යටතේ 2023.10.06 දින සිට පොලිස් සැරයන් තනතුරට උසස් කර ඇත.

මෙම නිලධාරියා වෙනුවෙන් 1982.07.28 දිනැති අංක 305 (09) දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව නිලධාරියා ජීවත්ව සිටිමින් සේවයේ සිටියා සේ සලකා, රජයේ සියළු වැටුප් වැඩිවීම්, වැටුප් පරිවර්තන, වැටුප් වර්ධක සහිතව වයස අවුරුදු 55 දක්වා මාසික වැටුප් හා දීමනා ලබාදීමට පොලිස්පතිතුමා විසින් කටයුතු සිදුකර ඇත.

මෙම නිලධාරියාගේ දෙමාපියන් 2023.10.06 වන දින පොලිස් මූලස්ථානයට කැඳවා මූල්‍යමය වශයෙන් මධ්‍යම සුබසාධක සහ යහසාධක යෝජනා ක්‍රමය මඟින් පිරිනමන ලද රුපියල් 103,808/- ක් සහ කණිෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ සංගමය මඟින් පිරිනමනු ලබන රුපියල් 125,000/- ක මුදල පොලිස්පතිතුමා විසින් ප්‍රදානය කරන ලදී.

මෙම අවස්ථාවට අදාල වීඩියෝ පටයක් සහ ඡායාරූප කිහිපයක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**